Department of Humanities, Rajarata University of Sri Lanka

**The Journal of Studies in Humanities**

**Volume 5 (I) 2019**

# මෙතෙක් අප්‍රකටව පවතින පැරණිම බ්‍රාහ්මී සෙල්ලිපි කීපයක් පිළිබඳ සටහන්

**චන්දිම බණ්ඩාර අඹන්වල**
පුරාවිද්‍යා හා උරුම කළමනාකරණ අධ්‍යයනාංශය,
සමාජීය විද්‍යා හා මානවශාස්ත්‍ර පීඨය,
ශ්‍රී ලංකා රජරට විශ්වවිද්‍යාලය, මිහින්තලය.
Email: *cbamba@rjt.ac.lk*

## Abstract

The inscriptions appear to be the most treasured sources about the Sri Lankan history. The inscriptions written from the beginning of 3 C. BC to recent past were scattered around Sri Lanka, the quantity of which is above 5,000 as evident from the data available in Department of Archeology. Among them, about 3,000 inscriptions relate to the earliest period (from 3 CBC to 1 CBC) of the Sri Lankan history. There may also be a considerable amount of unrevealed inscriptions relating to this earliest period. Accordingly, this paper presents unrevealed ten stone inscriptions relating to earlist period and one inscription written on a brick relating to medieval period. Of these inscriptions, the inscription written on a brick in Tamgoda Viharaya pertains to 7/8 CAC period, the inscription in Ginnoruva Kanda to 1 CAC period and other inscriptions certainly to 3/2 CBC period. This study attempts to reveal many contempory social, cultural and linguistic facts by studying these inscriptions.

**Keywords:** Inscriptions, early brahmi, Athichoda, Bibile, Pahala Kadugannava

## හැඳින්වීම

ආසන්න වශයෙන් ක්‍රිස්තු පූර්ව තෙ වැනි සියවසත් පළමු වැනි සියවසත් අතර කාලයට අයත් යැයි සලකන පැරණිම බ්‍රාහ්මී සෙල්ලිපි ශ්‍රී ලංකාවේ පැරණි ම ලේඛන ලෙස පිළිගෙන ඇත. දිවයිනේ උතුරු ප්‍රදේශය හැර අනෙකුත් සෑම තැනක් ම නියෝජනය වන පරිදි මෙවැනි ලිපි අවම වශයෙන් 3,000ක් පමණ ප්‍රමාණයක් විසිරීපැතිරී ඇත. බොහෝ විට බෞද්ධ භික්ෂූන් වහන්සේලාගේ වාසය සඳහා ශුද්ධ පවිත්‍ර කර කටාර කපා ගොඩනඟා ඇති ගල් පියැසි හෙවත් ගල්ලෙන්වල ඉදිරිපස සටහන් කර ඇති මෙම කෙටි ලේඛන පිළිබඳ ව ඒ පිළිබඳ විශේෂඥයින් මෙන්ම ආධුනිකයන් විසින් ද බොහෝ

පර්යේෂණ හා සොයාබැලීම් සිදුකර ඇත. දැනටත් දිවයිනේ විවිධ ස්ථානවලින් බ්‍රාහ්මී සෙල්ලිපි වාර්තා වෙමින් පවත්නා අතර අනාගතයේ දී ද තවදුරටත් එවැනි ලිපි වාර්තා වනු ඇත. 2007 දෙසැම්බර් හා 2008 ජනවාරි මාසයන් හි දී සිදුකරන ලද කඩිනම් පුරාවිද්‍යා ගවේෂණයන්ගෙන් අනාවරණය කර ගන්නා ලද පැරණිම බ්‍රාහ්මී ලිපි කීපයක් පිළිබඳ මූලික විස්තරයක් මෙම ලිපිය මඟින් ඉදිරිපත් කරනු ලැබේ. ශ්‍රමය හා කාලය පිළිබඳව මුහුණ දෙන්නට සිදු වූ අභියෝග හේතුවෙන් ලිපි කිහිපයක ස්පර්ශ ලාංඡන (estampages) වෙනුවට නේත්‍ර පිටපත් (eye copy) පමණක් සකස් කර ගැනීමට සිදු විය. ඉදිරියේ දී සිදුකරනු ලබන අභිලේඛන විද්‍යාත්මක අධ්‍යයනයක් මඟින් මෙම ලේඛන පිළිබඳ වැඩිදුර අද්‍යයන සිදුවනු ඇතැයි මෙම ලේඛකයා විසින් උදක්ම බලාපොරොත්තු වන අතර මෙම ලේඛනය එවැනි අධ්‍යයනයක් සඳහා පාදක ලියවිල්ලක් වනු ඇතැයි විශ්වාස කෙරේ.

## ක්‍රමවේදය

ප්‍රාථමිකව අදාළ ස්ථාන ගවේෂණය කිරීම සඳහා ප්‍රදේශීය දත්ත දායකයින්ගෙන් ලද තොරතුරු ඉවහල් කරගන්නා ලද අතරම එකී ස්ථාන හා අනෙකුත් ස්ථානයන්හි පියවි ඇසින් ක්‍රමවත්ව සිදුකරන ලද නිරීක්ෂණ මඟින් ගවේෂණ කටයුතු කරණ ලදි. පියවි ඇසින් හඳුනා ගන්නා ලද සෙල්ලිපි ක්ෂේත්‍ර සටහන් මඟින් වාර්තා කිරීම, නෙත් පිටපත් සැකසීම, ඡායාරූපගත කිරීම හා ස්පර්ෂ ලාංඡන සැකසීම ද සිදුකරන ලදි. අනතුරුව ඒවා විධිමත් ආකාරයෙන් සකසා, කියවීම නැතිනම් අධ්‍යයන සඳහා පාදක කරගන්නා ලදි. අකුරු හඳුනාගැනීමේ දි මේ දක්වා හඳුනාගෙන ඇති බ්‍රාහ්මි අක්ෂර මාලාව යොදාගන්නා ලද අතර ලිපි අර්ථ දැක්වීම සඳහා මේ විකල්ප තත්ත්ව සලකා බලමින් අදාළ වචන හා පාඨ වෙත මේ වන විටත් පූර්ව අභිලේකනඥයින් විසින් ලබා දී ඇති අර්ථ පදනම් කරගන්නා ලදි.

## සාකච්ඡාව

### මහියංගනය දඹාන, කිරිපොකුණ කන්ද

මහියංගණ ප්‍රදේශීය ලේකම් කොට්ඨාසයේ දඹාන, කිරිපොකුණ කන්ද පිහිටා තිබේ (07$^0$ 23’ 32.8”, 081$^0$ 05’ 37.6”). දඹාන වැදි ගම්මානයට මෙන් ම බෙහෙවින් ප්‍රකට මාවරගල ආරණ්‍ය සේණාසනය ආසන්නව මෙම කිරිපොකුණ කන්ද ස්ථානගත වී පවතී. මාවරගල සේනාසනය හා කිරිපොකුණ කන්ද අතර දුර මීටර් 500කට වැඩි නොවනු ඇත. මෙකී මාවරගල ආරණ්‍යය සේනාසනයට අයත් ව කටාර කොටා තිබෙන ගල්ලෙන් ගණනාවක් ම දැකගත හැකි අතර ඒවා අතර පැරණිම කාලයට අයත් ගල්ලෙන් බ්‍රාහ්මී ලිපි පහක් (Paranavitana 1970:56,57) පවතී. මෙම කිරිපොකුණ කන්ද නම් ස්ථානය තදාශ්‍රිත ගම්මානය වර්තමානයේ දී ප්‍රදේශවාසීන් විසින් ‘අඟහරුලෝකේ’ යන අපර නාමයකින් ද හඳුන්වන ආකාරය දැනගැනීමට පවතී.

දුෂ්කර ලෙස මඟ ගෙවාගෙන ගල්ලෙන් සහිත කිරිපොකුණ කන්ද මුදුනට ලඟා විය හැකි අතර එහි කටාර කෙටූ, පූර්ව බ්‍රාහ්මී ලිපි සහිත එකිනෙකට යාබදව පිහිටි ගල් ලෙන් දෙකක් දැකගත හැකි වේ. ඒ ලෙන් දෙසට හැරී සිටින අයෙකුගේ දකුණු දෙසින්

ඇති ලෙනේ කටාරයට පහළින් සටහන් කර ඇති ලිපිය ලිපිය දකුණේ සිට වමට ලියැවුණු ලිපියකි. මෙම ලිපි දෙකම ලංකාවේ පැරණිම කාලයට අයත් බ්‍රාහ්මී අක්ෂරයන්ගේ පරමාදර්ශී ලක්ෂණ පෙන්නුම් කරන බව නිරීක්ෂණය කළ හැකි වේ. එකිනෙක සමාන්තරව හා යාබද ව එකම දෙසට මුහුණ ලා පිහිටා ඇති මෙම ගල්ලෙන් ද්විත්වයේම ලෙන් කර්මාන්තය හා ලිපිකරණය එකම අනුග්‍රාහකයෙකුගේ අනුදැනුම මත සිදු වී ඇති බව ඒවායේ දක්නට ලැබෙන ඒකමිතිය අනුව සිතාගත හැකි වේ. එමන්ම මෙම ලිපි දෙකම 'ගමික' නම් සමාන තනතුරු දරන පුද්ගලයින් දෙ දෙනෙකු විසින් සකසා පරිත්‍යාග කර ඇත. නමුත් මෙම ලිපි දෙකේ පුද්ගල නාම සමඟ දැක්වෙන සම්බන්ධ විභක්ති ප්‍රත්‍යය පළමු වැනි ලිපිය සඳහා 'හ' වශයෙන් හා දෙ වැනි ලිපිය සඳහා 'ශ' වශයෙන් දෙ ආකාරයෙන් දැක් වේ.



**කිරිපොකුණ කන්ද ලිපි අංක 1 (නේත්‍ර පිටපතකි)**

**පෙළ**

**ගමික (දෙ) තහ ලිණි ශගශ**

**පරිවර්තනය**

**ගමික දෙතගේ ලෙණ සංඝයාටයි**



**කිරිපොකුණ කන්ද ලිපි අංක 2 (නේත්‍ර පිටපතකි)**

**පෙළ**

**ගමික වාහශ ලිණි ශගශ**

**පර්වර්තනය**

**ගමික වාහසගේ ලෙණ සංඝයාටයි**

**ලුණුබොක්ක, නාගිරි ආරණ්‍ය සේනාසනය**

අම්පාර දිස්ත්‍රික්කයට අයත් පදියතලාව ප්‍රදේශීය ලේකම් කොට්ටාශයේ කෝමාන ග්‍රාම නිලධාරි වසමට අයත් මනරම් පරිසරයක නාගිරි ආරණ්‍ය සේනාසනය පිහිටා ඇත

(07$^{0}$ 21’ 22.0”, 081$^{0}$ 19’ 44.6”). කටාර කෙටූ ගල්ලෙන් 8ක් ඇතුළු ගල්ලෙන් රැසක් මෙම ආරණ්‍ය සේනාසනය පිහිටි කන්දේ විවිධ ස්ථානවල විසිරී ඇත.

ප්‍රස්තුත ගවේෂණයේ දී පූර්ව බ්‍රාහ්මී ලෙන් ලිපි දෙකක් වාර්තාගත කළ හැකි විය. සංවිධානාත්මක ව හා විධිමත් ව සිදු කරන පුරාවිද්‍යාත්මක ගවේෂණයක් මඟින් මෙම ස්ථානයේ කන්ද පුරා විසිරී ඇති ගල්ලෙන් වල සටහන් කර ඇති තවත් සෙල්ලිපි ගණනාවක් අනාවරණය කරගත හැකි බව නොඅනුමාණ ය. පේළි දෙකකින් සමන්විත මෙම ලේඛනයේ පුද්ගල නාමය දැක්වෙන ස්ථානයේ ආරම්භක කොටස විනාශ වී ඇත හෙයින් මෙම පරිත්‍යාගය කළ තැනැත්තාගේ නමෙහි මුල් කොටස හඳුනාගැනීම අපහසු වේ. එහි පවතින ඉඩහසර අනුව අවම වශයෙන් අකුරු ත්‍රිත්ත්වයක් විනාශ වී ඇති බව අනුමාණ කළ හැකි වේ. එමෙන් ම මෙම ලේඛනයේ ආරම්භයේ දැක්වෙන වචනය ලංකාවේ අභිලේඛන විද්‍යාව හැදෑරීමේ දී ඉතා වැදගත් වන බව පෙන්වා දිය හැකි වේ. ‘අතිචොඩ’ වශයෙන් සිව්වැනි අකුර යම් අවිනිශ්චිතතාවකින් යුතුව කියවා ගත හැකි අතර මේ දක්වා ලංකාවෙන් අනාවරණය වූ පැරණිම සෙල්ලිපියක මේ හා සමාන වචනයක් යෙදී ඇති බව හඳුනාගත හැකි නොවේ. අති යන්නෙහි ‘හස්ති’ යන්න ගැබ්ව ඇතත් ඒ හා සමඟ යෙදෙන චොඩ යන්න අර්ථකතනය කිරීම අපහසු වේ. ඒ අනුව මෙකී ලිපිය විධිමත් අයුරින් පිටපත් කර යෙදී ඇති අක්ෂරය නිශ්චිත වශයෙන් තහවුරු කරගැනීමෙන් ඉක්බිති ඒ සඳහා අර්ථකතනයක් සැපයීම වඩාත් ප්‍රඥාගෝචර වේ.


**පෙළ**

**අතිචො(ඩ) .. .. .. (ග) තිශහ ලෙණේ**

**අ(ග)ත අ(නග)ත චතුදිශගශ**

**පරිවර්තනය**

**අතිචොඩ . . . ග තිස්සගේ ලෙණ. පැමිණියා වූත් නොපැමිණියා වූත් සිව්දිග සංඝයාටයි**



**ලුණුබොක්ක, නාගිරි ආරණ්‍ය සේනාසනයේ ලිපි අංක 2**
**(ඡායාරූප පාදක කරගෙන පරිගණකයෙන් සකසන ලද පිටපතකි)**

**පෙළ**


**පරුමක හඩවහ පුත පරුමක තිශ පුත දවතිපුශ ලෙණේ ශගශ**

**පරිවර්තනය**

**ප්‍රමුඛ හඩවගේ පුත් ප්‍රමුඛ තිස්සගේ පුත් දෙවතිපුස්සගේ ලෙණ සංඝයාටයි**

**මොරගොම්මන, ඉනුල්දෙණියගොඩකන්ද**

බදුල්ල දිස්ත්‍රික්කයේ බිබිල ප්‍රදේශීය ලේකම් කොට්ඨාසයට අයත් හාමාපොල 103 සී, කොල්ලාකැටිය ග්‍රාම නිලධාරි වසමේ මොරගොම්මන, ඉනුල්දෙණියගොඩ කන්ද පිහිටා තිබේ (07$^{0}$ 21' 03.6", 081$^{0}$ 00' 58.6"). මැටිගහපුගල්ගේ, වෙදගල්ගේ ආදී නම්වලින් හඳුන්වන කටාර කෙටූ ගල්ගුහා ඇතුළු තවත් ගල්ගුහා කීපයක් ම මෙම කන්ද පුරා විසිරී තිබේ. කන්දේ තැන තැන නිධන් හොරුන් විසින් කරන ලද විනාශ කිරීම් දකින්නට ඇත. මෙම කන්ද මුදුනේ ගල් ලෙණක කටාරයට පහළින් පහත දැක්වෙන සෙල්ලිපිය සටහන් කර ඇත. බොහෝ ගල්ලෙන් ලිපි මෙන් ම මෙම ලිපිය ද තරමක් ගැඹුරට සටහන් කර ඇති අතර ලංකාවේ දක්නට ලැබෙන පූර්ව බ්‍රාහ්මී සෙල්ලිපි හා අනුගත වෙමින් සාම්‍ය ලක්ෂණ පෙන්නුම් කරන ආකාරය දැකගත හැකි වේ.



**මොරගොම්මන, ඉනුල්දෙණියගොඩකන්ද ලිපිය (නේත්‍ර පිටපතකි)**

**පෙළ**

**අශ ශුමනගුතශ ලෙණේ ශගශ**

**පරිවර්තනය**

**ආයුෂ්මත් සුමනගුත්තගේ ලෙණ සංඝයාටයි**

**සෙණසුන්ගල රජමහා විහාරය**

බදුල්ල දිස්ත්‍රික්කයේ මහියංගණය ප්‍රදේශීය ලේකම් කොට්ඨාශයේ පිහිටි සෙණසුම්ගල ආරණ්‍ය සේනාසනය (070 18' 40.2", 0810 06' 58.1) සද්ධාතිස්ස (ක්‍රිස්තු පූර්ව 137-119) රාජ සමයට අයත් බව ජනප්‍රවාද අනුව කියැ වේ. මෙම ගුහාවේ ඇතුළත වපසරිය භිත්ති මඟින් වෙන්කර පිළිම ගෙය, බණ මඩුව, දාන ශාලාව හා සංඝාවාසය ලෙස සකසා තිබේ. කටාර කෙටූ තවත් ගල්ගුහාවක් ඇතුළු ගල්ලෙන් කීපයක් ම කන්දේ පිහිටා ඇත. චෛත්‍යයකට අයත් යැයි සැලැකෙන අවශේෂ හා තවත් පුරාවිද්‍යාත්මක අවශේෂ කන්ද මුදුනේ දැකගත හැකි ය.

මෙම ගල් ලෙනේ ඉහළ කටාරයට පහළින් පැරණිම කාලයට අයත්, පූර්ව බ්‍රාහ්මී ලෙන් ලිපියක් දැකගත හැකි අතර බෙහෙවින් විනාශ වී ඇති ලිපියේ පියවි ඇසින් දැක හඳුනාගත හැක්කේ අක්ෂර කීපයක් පමණි.



**සෙනසුම්ගල විහාර ලිපිය (කඩඉරි මඟින් අක්ෂර පැහැදිළි ස්ථාන පෙන්නුම් කෙරේ.)**

**පෙළ**

**.. .. .. ම .. .. .. .. .. ශගශ**

**පරිවර්තනය**

**. . . ම . . . . සංඝයාටයි**

**පහළ කඩුගන්නාව, මාවෙල කන්දේ රජමහා විහාරය**

සබරගමුව පළාතට අයත් කෑගල්ල දිස්ත්‍රික්කයේ මාවනැල්ල ප්‍රදේශීය ලේකම් කොට්ඨාශයේ හිඟුල ග්‍රාම නිලධාරි වසමේ මාවෙල කන්දේ පුරාණ විහාරය පිහිටා ඇත (07° 15' 04", 080° 29' 54). කොළඹ සිට මහාමාර්ගයේ පැමිණෙන්නෙකු කඩුගන්නාව දුර්ගය තරණය කිරීමේ දී හමුවන ප්‍රසිද්ධ පහළ කඩුගන්නාව පුරාණ අම්බලම ඉදිරිපසින් පහළට ගමන් ගන්නා අඩි පාරේ මීටර් 500ක් පමණ ගමන් කිරීමෙන් මෙම විහාරයට ළඟා විය හැකි ය.

වට්ටගාමිණී අභය (ක්‍රිස්තු පූර්ව 103-102 හා 87-76) රජු විසින් කරවන ලද විහාරයක් වශයෙන් ජනප්‍රවාදයේ පිළිගැනෙන මෙම විහාරය වත්මන් උඩුනුවර ලංකාතිලක විහාරයට අයත් විහාරස්ථාන පහ අතුරින් එකකි. කටාර කොටා ඇති ගල් ගුහා ත්‍රිත්වයකින් මෙම ස්ථානය සමන්විත වන අතර එයින් පළමු වැන්න චෛත්‍ය ශාලාවක් ලෙස සකස් කොට ඇත. මෙහි කුඩා ප්‍රමාණයේ ස්තූපයක් දක්නට ඇති අතර ප්‍රදේශවාසීන්ගේ විශ්වාසය අනුව ගම්පොළ රාජධානී සමයේ හෙණකඳ බිසෝබණ්ඩාර දේවිය විසින් මෙම චෛත්‍ය ඉදිකරවා ඇති අතර මෑත කාලයේ නිධන් හොරුන්ගේ ක්‍රියාකාරීත්වය විසින් මෙම චෛත්‍යය

විනාශ වී ඇත. මෙම ස්තූපය සඳහා භාවිත විශාල ප්‍රමාණයේ ගඩොළු ගම්පොළ යුගයට වඩා පැරණි කාලයකට අයත් ය. දෙ වැනි ගුහාව තුළ පිළිම ගෙය දක්නට ඇති අතර එහි මහනුවර යුගයට අයත් අඩි 30කට ආසන්න ප්‍රමාණයක් ගන්නා සැතපෙන බුදුපිළිමයක් පිහිටුවා තිබේ. මහනුවර සම්ප්‍රදාය නියෝජනය කරන චිත්‍ර එහි ඇඳ තිබේ. සෙසු ගුහා දෙකට සාපේක්ෂක ව කුඩා තෙ වැනි ගුහාව භික්ෂු ආවාසය වශයෙන් භාවිත වෙයි. චෛත්‍ය ශාලාව හා පිළිම ගෙය වශයෙන් භාවිත ලෙන්වල කටාරයට පහතින් පූර්ව බ්‍රාහ්මී යුගයට අයත් සෙල්ලිපි දෙකක් කොටා තිබේ.

මෙයින් පිළිම ගුහාවේ දක්නට ඇති ලිපිය පුරාවිද්‍යා දෙපාර්තමේන්තුව විසින් පිටපත් කර ඇත. චෛත්‍ය සහිත ගුහාවේ ද තරමක් හායනයට ලක් වූ පූර්ව බ්‍රාහ්මී ලිපියක් කටාරයට පහළින් කොටා තිබේ. මෑත කාලයේ කරන ලද ශාලා බිත්තියේ නිර්මාණ කටයුතු සමඟ මෙම ලිපියේ වම්පස අකුරු කීපයක් විනාශයට පත් ව ඇති අතර අකුරු 14ක් පමණ හොඳින් හඳුනා ගත හැකි ව පවතී. මෙම ලිපියේ තුන් වන, සය වන, සත් වන, අට වන, දස වන, දහතුන් වන හා පසළොස් වන යන අකුරු උඩුයටිකුරු ආකාරයට ලියා ඇත.



**පහළ කඩුගන්නාව මාවෙල කන්දේ රජමහා විහාරය (ලෙන්ලිපි අංක 1) (නේත්‍ර පිටපතකි)**

**පෙළ**

**[පරු[ ම(ක) (කු) යන ච ගපති ශම කුලශ [ලෙනේ]**

**පරිවර්තනය**

**ප්‍රමුඛ කුයන ද ගෘහපති ශම පවුලේ ද ලෙනයි**

චෛත්‍ය ශාලාවේ දොරටුව ඉදිරිපස පිහිටුවා ඇති කොරවක්ගල් දෙකෙන් දකුණු පස පිහිටි කොරවක් ගල මත පූර්ව බ්‍රාහ්මී අක්ෂරයෙන් ලියන ලද පහත දක්වා තිබෙන ලිපිය දැකිය හැකි ය. එම ලිපියේ යම් කිසි කෘත්‍රිම බවක් බැලූ බැල්මට පෙනී ගියත් එකී ලිපිය ව්‍යාජ ලිපියක් වශයෙන් හඳුනාගැනීමටට ප්‍රමාණත් සාධක හමු නොවේ. අනෙක් අතට මෙම ස්ථානයේ ව්‍යාජ ලේඛනයක් සටහන් කිරීමෙන් කිසිවෙකුට කිසිම ප්‍රයෝජනයක් අත්වන බවක් ද දැකගත හැකි නොවේ. මෙම ලිපිය සටහන් කිරීමේ පුළුල අඩු තියුණු රේඛාවක් යොදාගෙන ඇති ආකාරය දැකගත හැකි වේ. මෙම ලේඛනයේ දෙ වැනි ව දැක්වෙන 'ති' අක්ෂරය විශේෂ උත්සාහයක් දරමින් ආකර්ශනීය මුහුණුවරක් නිරූපණය කිරීමට උත්සාහ දරා ඇති ආකාරය දැකගත හැකි වේ.



**මෙම කොරවක්ගල මත මෙම කෙටි ලිපිය සටහන් කර ඇත.**



**පහළ කඩුගන්නාව මාවෙල කන්දේ රජමහා විහාරයේ කොරවක්ගල මත ඇති ලිපිය**

**පෙළ**
**බතිමශ**

**පරිවර්තනය**
**බත්තිම (නම් තැනැත්තා)ගේ**

**බිබිල පොතුබන්ධන, ටැම්ගොඩ රජමහා විහාරය**

බදුල්ල දිස්ත්‍රික්කයේ බිබිල ප්‍රදේශීය ලේකම් කොට්ඨාසයේ ඊතණවත්තේ තානායම්ගම ග්‍රාමයේ පිහිටා ඇති ටැම්ගොඩ විහාරය ($07^0$ 06’ 48.1”, $081^0$ 12’ 46.7”) ප්‍රදේශයේ පැරණි ම විහාරයකි. මෙම විහාරස්ථානය මහනුවර යුගයේ වාස්තුවිද්‍යා නිර්මාණ ලක්ෂණ නිරූපණය වන ගොඩනැඟිලි කිහිපයකින් යුක්ත ය.

මෙම ස්ථානයේ සෙල්ලිපි කිහිපයක් ම තිබේ. එයින් පිළිම ගෙයට පසෙකින් පිහිටි සණ්ටාර කුළුණට යාබද ව ඇති ලිපිය සෙනරත් පරණවිතානගේ අධ්‍යයනයට ලක් වූවකි (Paranavitana 1955:80-111). මීට අමතර ව අක්ෂර සහිත තරමක් විශාල අර්ධ වෘත්තාකාර ගඩොළු කැටයක් විහාරයෙන් සොයාගෙන තිබේ. වසර ගණනාවකට පෙර විහාරයේ චෛත්‍ය ප්‍රතිසංස්කරණ අවස්ථාවේ දී හමු වූවා යැයි කියන මෙම ගඩොළු කැටය (මෙහි

ස්පර්ශ ලාංඡනය පළමු වරට මෙම ලිපියේ පල වේ.) හා තවත් එවැනි ම ලේඛනයක් සහිත ගඩොළු කැටයක් පිළිබඳ ව පරණවිතාන විසින් සඳහන් කළ ද (1955:81) මේ වන විට අනෙක් ගඩොළු කැටය දැකගැනීමට නැත. පරණවිතානට අනුව අදාළ ලිපිය හා අර්ථය පහත පරිදි ය.




**ටැම්ගොඩ විහාරයේ ගඩොළු කැටය මත ලියූ ලිපිය**

**පෙළ**
**තුන්වනෙන තුන්ව**

**පරිවර්තනය**
**තෙවැන්නේ තෙවැන්න**

අක්ෂර විද්‍යානුකූල ව මෙම ලිපිය ක්‍රිස්තු වර්ෂ 7-8 සියවස්වලට හෝ ඒ තදාසන්න කාලයකට අයත් බවට නිර්ණය කළ හැකි ය. එහි දැක්වෙන අක්ෂර සීගිරි කැටපත් පවුරේ ලියා ඇති, ක්‍රිස්තු වර්ෂයෙන් අට වැනි සියවසේ අක්ෂරවලට සමීප සමානතාවක් පෙන්වයි (Paranavitana 1956:xiv-xxxii)

විහාරයේ පිළිම ගෙයි පිවිසුමේ වම් පසින් පිහිටි මුරගලේ කෙටි බ්‍රාහ්මී ලිපියක් කොටා තිබේ. මෙම මුරගලේ ද පසෙකින් පිහිටි අනෙක් මුරගලේ මෙන් ම අර්ධ උන්නතාකාර පුන් කලසක් නිරූපණය කර ඇත. මුරගල සකස් කර තිබෙන පාෂාණයේ දුර්වල බව හා දේශගුණික සාධක හේතුවෙන් මෙම ලිපිය දැඩි සේ හායනයට ලක් ව ඇති බව පෙනේ. පේළි දෙකකින් සමන්විත මෙම ලිපිය අක්ෂර විද්‍යානුකූල ව ක්‍රිස්තු වර්ෂයෙන් පළමු වැනි හෝ දෙ වැනි සියවසට අයත් බවට නිර්ණය කළ හැකි ය (මෙම ලිපියේ පෙළ කියවීම ආචාර්ය පියතිස්ස සේනානායක විසිනි).



**ටැම්ගොඩ විහාරයේ මුරගල ඉදිරිපස පහළින් සටහන් කර ඇති ලිපිය**

**පෙළ**
**[සි] රහල ථෙ (රහ)**
**පුලගතේ**

**පරිවර්තනය**
**සැරද රාහුල ථෙරගේ පූර්ණ සටයයි**

**ගින්නෝරුව කන්ද**

බදුල්ල දිස්ත්‍රික්කයට අයත් මහියංගණ ප්‍රදේශීය ලේකම් කොට්ඨාශයේ ගින්නෝරුව ග්‍රාම නිලධාරි වසමේ ගින්නොරුව කන්ද පිහිටා තිබේ ($07^0$ 30’ 00.2”, $080^0$ 59’ 26.7”) පුරාවිද්‍යා රක්ෂිතයක් වන මෙම කන්දේ කටාර කෙටූ හා නොකෙටූ ගල්ලෙන්, ස්තූප පාදම් හා ගඩොළු අවශේෂ විසිරී ඇති ආකාරය දැකගත හැකි වේ.

කන්ද මධ්‍යයේ තිබෙන කටාර කෙටූ එක් ගල්ලෙණක කටාරයට පහළින් අපර බ්‍රාහ්මී යුගයට අයත් මෙම ලෙන් ලිපිය කොටා ඇත.



**ගින්නෝරුව කන්ද ලෙන් ලිපිය**

**පෙළ**
**සිදධම අබගිරි වසික**

**අමඋතර(හ)**
**පරිවර්තනය**
**යහපතක් වේවා, අබයගිරියේ වාසය කරන්නා වූ, අමෝත්තරගේ ය**

**නිගමනය**

ඉහතින් විස්තර කළ ලිපිවල විවිධ ජන කණ්ඩායම් පිළිබඳ තොරතුරු නාමික ව අනාවරණය වේ. අශ (මොරගොම්මන), අතිචොද, පරුමක (ලූණුබොක්ක), ගමික (අඟහරුලොකේ) ආදි අභිධාන භාවිත කළ පුද්ගලයින් ද ඒ අතර සිටී ශුමණගුත

(මොරගොම්මන), තිශ (ලූණුබොක්ක), දෙත, වාහ (අඟහරුලොකේ), බතිම (මාවෙල), අමැතර (ගින්නෝරුව) යනු එම ලිපිවල දැක්වෙන සංඥා නාම කිහිපයකි. මාවෙල විහාර ලිපියේ අභිලේඛනාත්මක වටිනාකම මෙන් ම කාලනිර්ණ වටිනාකමක් ද ඇති බව නිශ්චය කළ හැකි වේ. අදාළ ලිපිය අන්තර්ගත වාස්තුවිද්‍යාත්මන අංගයක් වන කොරවක්ගල සඳහා කාලනිර්ණයක් ඉදිරිපත් කිරීමට එහි තිබෙන අක්‍ෂර මඟින් හැකි වන්නේ ද යන්න වාස්තු විද්‍යා හා කලා ඉතිහාසඥයන් විසින් සලකා බැලිය යුතු වේ.

## ස්තූතිය

මෙම සෙල්ලිපි අනාවරණය කරගැනීම සඳහා ඉවහල් වූ ක්ෂේත්‍ර ගවේෂණ සඳහා සහය වූ මානව විද්‍යා පර්යේෂක එච්.ජී. දයාසිසිර මහතා, ගවේෂණ පහසුකම් සැප යූ සම්මානිත මහාචාර්ය, ගණනාථ ඔබේසේකර මහතා, මාවෙල විහාර ගවේෂණය දී සහය දුන් පුරාවිද්‍යාඥ මහින්ද කරුණාරත්න මහතා ඇතුළු අදාළ සෙල්ලිපි පිහිටි ස්ථානයන්හි දී විවිධ අයුරින් සහය ලබාදුන් සියලු දෙනාට ස්තූතිය පිරිණැමේ.

## පරිශීලිත ග්‍රන්ථ

අඹන්වල, සී.බී. හා එම්. කරුණාරත්න (2010), මලය දේශයට තවත් පිවිසුමක් : කඩුගන්නාව පහළ මාවෙල රජමහා විහාරය පිළිබඳ ව සිදුකෙරුණු නව පුරාවිද්‍යාත්මක අනාවරණය කිරීම් හා මලය දේශයේ පුරාවිද්‍යාව, (ජාතික පුරාවිද්‍යා සමුළුව, 2010), Vol. I, පුරාවිද්‍යා දෙපාර්තමේන්තුව, කොළඹ. (පිටු 101-110)

දයාසිසිර, එච්.ජී. හා සී.බී. අඹන්වල (2009), මෙතෙක් අනාවරණය නොවූ බ්‍රාහ්මී සෙල්ලිපි කීපයක් පිළිබඳ සටහනක්, **The Royal Asiatic Society of Sri Lanka, 3rd Research Conference**, March 27th-28th, 2009, Mahaweli Centre Auditorium, Colombo, Sri Lanka. (59p.)

**රාජාවලිය** (1997), සංස්කරණය ඒ.වී. සුරවීර, අධ්‍යාපන ප්‍රකාශන දෙපාර්තමේන්තුව, කොළඹ.

**සිංහල සෙල්ලිපි වදන් අකාරාදිය** (2004), සංස්කරණය සිරිමල් රණවැල්ල, පුරාවිද්‍යා දෙපාර්තමේන්තුව, කොළඹ.

Ambanwala, C.B. & M. Karunarathne (2009), Another Approach to the *Malaya Desa* in Ancient Sri Lanka: New Archaeological Revelation in and around Pahala-Mavela Temple at Kadugannava, **Peradeniya University Research Sessions - PURSE 2009**, Chief Editor: C. Sivayoganathan, University of Peradeniya, Sri Lanka, 3rd Dec.2009 (611-613pp.)

Dayasisira, H.G. & C.B. Ambanwala (2010), a note on some recently discovered Brahmi Inscriptions, **12th International Conference on Sri Lanka Studies - ICSLS**, The Royal Asiatic Society of Sri Lanka and The Open University of Sri Lanka, 18th-20th March 2010, Colombo, Sri Lanka. (113p.)

Paranavitana, S. (1955), Tämgoda Vihara Pillar-Inscription of Sirimegha **Epigraphia Zeylanica** vol.V, Part I ed.by. S. Paranavitana, and C. E. Godakumbura, Archaeology Department, Ceylon. (80-111)

Paranavitana, S. (1956), **Sigiri Graffiti, being Sinhalese verses of the eighth, ninth and tenth centuries**, The Government of Ceylon by Geoffrey Cumberlege, London.

Paranavitana, S. (1970), **Inscriptions of Ceylon** Vol. I Department of Archaeology, Ceylon

Paranavitana, S. (1983), **Inscriptions of Ceylon** Vol. II, Part I, Department of Archaeology, Sri Lanka.